# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## ආර්ථික සේවා ගාස්තුව (ESC)

### 2009.12.31 දිනෙන් අවසන් වූ කාර්තුව (09103) සඳහා වාර්තා ඉදිරිපත් කිරීම සහ ගෙවීම් කිරීම

2009.12.31 දිනෙන් අවසන්වූ කාර්තුව සඳහා ආර්ථික සේවා ගාස්තු සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කිරීම සහ ගෙවීම් සිදු කිරීම සඳහා වූ අවසාන දිනය

**2010 ජනවාරි 20**

බව ආර්ථික සේවා ගාස්තු ගෙවීම සඳහා බැඳෙන බදු ගෙවන්නන් වෙත මෙයින් සිහිපත් කරනු ලැබේ.

**සටහන :**

2009 අංක 16 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත මගින් සංශෝධිත 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත අනුව පහත සඳහන් ලැබීම්වලින් වන පිරිවැටුම ආර්ථික සේවා ගාස්තු සඳහා යටත් වන පිරිවැටුමට ඇතුලත් නොවේ.

- 2009 ජනවාරි 01 දින හෝ ඉන්පසු, එහෙත් 2009 දෙසැම්බර් 31 දිනට පෙර යම් ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් අපනයනය කිරීම ,
- අපනයනකරු විසින් වැඩිදුර සකස් කිරීමක් හෝ නිෂ්පාදනය කිරීමක් නොකර, අපනයනය කිරීම සඳහා, යම් ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් නිෂ්පාදනය කරන නිෂ්පාදකයා විසින් යම් අපනයනකරුවකුට 2009 දෙසැම්බර් 31 දිනට පෙර එහෙත් 2009 ජනවාරි 01 දින හෝ ඉන්පසු සිදු කළ සැපයුමක් ,
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් අනුමත යම්,
  - (අ) සංචාරක හෝටලයක ;
  - (ආ) දේශීය සංචාරක ක්‍රියාකරුවෙකුගේ ; හෝ
  - (ඇ) දේශීය සංචාරක නියෝජිතයෙකුගේ

  2009 දෙසැම්බර් 31 දිනට ප්‍රථම, එහෙත් 2009 ජනවාරි 01 දින හෝ ඉන්පසු අදාල වන ඕනෑම ක්‍රියාකාරකමක්.

**ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවීම් කළ හැකිය.**

**[ගෙවීම් කිරීමට පෙර බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය සහ කාර්තුව (බදු කාලය) නිවරුදිව සඳහන් කර ඇත්දැයි පරීක්ෂා කරන්න.]**

ගෙවීම් කිරීම හෝ වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යම් සහායක් අවශ්‍ය නම්, හෝ ඉහත කාර්තුවට අදාල වාර්තාව ඔබ වෙත ලැබී නොමැතිනම් කරුණාකර ඔබට ළඟම තිබෙන දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලයේ නියෝජ්‍ය කොමසාරිස් හෝ පහත අංශය අමතන ලෙස දන්වමි.

| | |
|---|---|
| ලේකම් අංශය | - දුරකථන 011 - 3009262, 011 - 3009248 |
| බදු සේවා අංශය | - දුරකථන 011 - 3009027, 011 - 3009040, 011 - 3009018 |
| ආර්ථික සේවා ගාස්තු අංශය | - දුරකථන 011 - 2302459, 011 - 2302294, 011 - 2302293 |

ඔබේ වාර්තාව කොළඹ 02, යුනියන් පෙදෙස, අංක 278 , ඇක්සස් කුළුන, (Access Tower) 10 වෙනි මහලෙහි පිහිටි ආර්ථික සේවා ගාස්තු අංශයට පමණක් ඉදිරිපත් කළ යුතු බව කරුණාවෙන් සලකන්න.

**කරුණාකර කලට වේලාවට ගෙවීම් කරන්න.**

**----ගෙවන ලද ආ.සේ.ගා. ඔබ විසින් ගෙවිය යුතු ආදායම් බද්දට හිලව්කළ හැක---**

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

ý÷¸ - <ò$µ{$úÆù$è õ×æð